# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## බෞද්ධ ශිෂ්ටාචාරය - 13 ශ්‍රේණිය

සැකසුම - **රත්නපුර අධ්‍යාපන කලාපය**

**තිළිණ ජයවර්ධන** - ර/මල්වල මහා විද්‍යාලය

## 7 වන සතිය

**01.** රාජාණ්ඩු පාලන ක්‍රමය තුල විශේෂයේන් අධිරාජයක් ගොඩනැගිම ප්‍රමාණවත්ව දක්නට ලැබුණි මේ බලය තහවුරු කිරිමේදි පාලකයන් විසින් මත්ස්‍ය න්‍යාය ක්‍රියාත්මක කළ බව දක්නට ලැබෙයි මෙම මත්ස්‍ය න්‍යාය යනුවෙන් අදහස් කළේ

**(1)** රජ්‍යය පවත්වගෙන යාම සඳහා රජුට සහයට තවත් පිරිසක් පත් කිරිම

**(2)** රාජ්‍යයේ සුවිශේෂි තනතුරු තම ඥතින්ට මිතුරන්ට පිරිනැමිම

**(3)** කූට උපක්‍රම මගින් රාජ්‍යයන් අල්ලා ගැනිමයි

**(4)** බලවත් රාජ්‍ය දුබල කර යටත් කර ගැනිමයි

**(5)** විවාහ සබඳතා මගින් තම රාජ්‍යය පුළුල් කර ගැනීමයි (....)

**02.** සාමඤ්ඤඵල සුත්‍රයට අනුව දස වස්තුවක මිනිසා දෘෂ්ටියක් ඉදිරපත් කල ශාස්තෘවරයා වන්නේ

**(1)** පූර්ණ කස්සප **(2)** අජිත කේසකම්කලි

**(3)** පකුධ කච්චායන **(4)** මක්කලී ගෝශාසා

**(5)** සංජය බෙල්ලට්ඨි පුත්ත (....)

**03.** බුද්ධකාලීන භාරතයේ විවිධ ජීවන වෘත්තීන් පැවති බවට සාධක හමුවේ සිටුවර පන්තියකත් බිහිවීම, වෙළඳ නහර පිළබඳ තොරතුරු හමු වීම, භාරුකච්ඡ වරාය ප්‍රධාන වරායන් ඔස්සේ නැව් මගින් භාණ්ඩ ආයාත නිරියත කිරීම වැනි සාධක ප්‍රකට කෙරෙන්නේ,

**(1)** බුද්ධ කාලීන භාරතයේ දියුණු නගර පැවති බවයි.

**(2)** බුද්ධ කාලීන භාරතයේ භාණ්ඩ ප්‍රවාහනයට දියුණු ක්‍රම පැවති බවයි.

**(3)** බුද්ධ කාලීන භාරතය වාණිජ්‍යකරණයට ලක්ව පැවති බවයි.

**(4)** නැව් මගින් භාණ්ඩ ආයාත නිර්යත කළ බවයි.

**(5)** බුද්ධකාලී න භාරතයේ විරැකියා අහිමි වු බවයි. (....)

**04.** සියලු රටවැසියන්ට පමණක් නොව පක්ෂීන්ට, සිවුපාවුන්ට පවා ඇතැම් රැකවරණය සැකසීම සිය රටෙහි අධාර්ජික ක්‍රියාවලට ඉඩ නොතිබීම, දිළිඳු භාවය නැතිකොට ආර්ථික සංවරධනය පිණිස කටයුතු කිරීම, සිය රටෙහි වෙසෙන විශාරද මහණ බමුණන්ගෙන් උපදෙස් ලබාගෙන දැහැමින් රට පාලනය කිරිම යන කරුණු ඇතුලත් වන බෞද්ධ දේශපාලන මූලධර්මය හඳුන්වන්නේ,

**(1)** සතර සංග්‍රහ වස්තු නමිනි

**(2)** සප්ත අපරිහානීය ධර්ම නමිනි

**(3)** දස සක්විති වත් නමිනි

**(4)** දසරාජ ධර්ම නමිනි

**(5)** දස පින් කිරියවත් නමිනි (....)

**05.** ''ලද දෙයින් සතුටු නොවීම සාමාන්‍ය මිනිස් ස්වභාවයයි. බොහෝ ධනය හා සම්පත් ඇති රජුද, බලවත්තුද තෘප්තිමත් භාවයට පත් නොවීම මිය යයි. ''එසේ වන්නේ මිනිසා තෘෂ්ණාවට ලක්වන බැවිනි. මේ තත්තවය අවබෝධ කර ගත් බෞද්ධයා ආශාවන් පසු පස හඹා යාම වෙනුවට අශාවන් අඩු කර ගැනීමට උත්සහ ගනියි'' ඉහත සඳහන් ඡේදයෙන් ගම්‍යවන බෞද්ධ සදාචාර ධර්මය හැඳින්වීමට වඩාත් සුදුසු වචනය වන්නේ,

**(1)** මනෙච්ඡතාවයයි **(2)** බහු කිච්ඡතාවයයි

**(3)** අල්පකෘත්‍යභාවයයි **(4)** සුභරතාවයයි

**(5)** අල්පේච්ඡතාවයයි (....)

**06.** '' පංචශිඛ'' නම් ගාන්ධර්වරයා බුදුරදුන් වෙත පැමිණ බේලුව නම් ආණ්ඩු වීණාව වාදනය කරමින් සිය පෙම්වතිය වෙනුවෙන් ප්‍රබන්ධිත ගී පෙළක් ගායනා කළේය. මෙහිදී බුදු රජාණන් වහන්සේ පංචශිඛයේ ගැයන - වාදන දක්ෂතාවය ඇගයීමට ලක් කළේය. මේ සිද්ධිය සඳහන් වන්නේ,

**(1)** මහා මංගල සූත්‍රයේය

**(2)** සක්කපඤ්හ සූත්‍රයේය

**(3)** සිඟාලෝවාද සූත්‍රයේය

**(4)** ව්‍යග්ග පජ්ජී සූත්‍රයේය

**(5)** මහා පරිනිබ්බාන සූත්‍රයේය (....)

**07.** බුදුරජාණන් වහන්සේ ජාති, ජරා, ව්‍යාධි, මරණාදියෙන් එනම් ලෞකිකත්වයෙන් එතෙර වීමට මඟ වෙන් වූ ලෝකෝපකාර මග කියූ ශාස්තෘවරයෙකු ලෙස හැඳින්වීම නිවැරදි වුවත්, ලෞකික දියුණුව සඳහාද උන්වහනසේ අනුශාසනා කළහ. එහෙයින් උන්වහන්සේ උභයාර්ථ සාධනය සඳහා අනුශාසකයින් යොමු කල ශාස්තාවරයෙකි. පෙළ සාහිත්‍ය තුල ගුරුවරයෙකු ලෙස උන්වහනසේ ඇගයීම සඳහා විවිධ පරියාය වචන භාවිතා වි ඇත. ඒ අතර මාර්ගය නිවැරදිව දකින්නා යන අදහස දෙන්නේ,

**(1)** මග්ගඤ්ඤූ **(2)** මග්ගක්ඛාය

**(3)** මග්ගකෝවිදෝ **(4)** සබ්බඤ්ඤූ

**(5)** සර්වඥ (....)

**08.** ඕනෑම පුද්ගයකුගේ දියුණුව හෝ පරිහානිය අදෘශ්‍යමාන බලවේගයකින් හෝ බාහිර අධිකාරියකින් සිදු නොවේ. බෞද්ධ ඉගැන්වීමට අනුව කෙනෙකු දියුණු වන්නේ හෝ පරිහාණියට පත් වන්නේ ඒ ඒ පුද්ගල ක්‍රියාකාරිත්වය මතයි. බුද්දක නිකායේ උරග වග්ගයේ පරාභවසුත්‍රයට අයත් නොවන පිරිහීමේ කරුණ වන්නේ ,

**(1)** දහමට අකමැති බව

**(2)** අසත් පුරුෂත්වයට ප්‍රිය කරන බව

**(3)** අලසකම

**(4)** මහළු වියේ අයකු නව යොවුන් තරුණියක සරණපාවා ගැනීම

**(5)** අටලෝදහමින් කම්පා වීම (....)

**09.** පවිටු මිතුරන් හා අධම මිනිසුන් ඇසරු නොකළ යුත්තාහ. කළණ මිතුරෝ හා උතුම් මිනිසුන් ඇසුරු කළ යුත්තාහ. යනුවෙන් සඳහන් ධම්පද ගාථාව වන්නේ,

**(1)** '' න අත්තහේතු න පරස්ස හේතු.................''

**(2)** '' ආචරියා බ්‍රහ්මචාරියං.........''

**(3)** නභජේ පාපකේ මිත්තන් .......''

**(4)** '' න පරේසං විලෝමහී....''

**(5)** '' අක්කෝධෙන ජිනේ කෝධං......'' (....)

**10.** ''අණන සූත්‍රයේ'' සඳහන් වන චතුර්විධ සුඛයන් අතර ''අනවජ්ජ සුඛ'' යනුවෙන් අදහස් කරන්නේ,

**(1)** භව භෝග සම්පත් බහුලව රැස් කර ගැනීමෙන් ලබන සතුටයි.

**(2)** දැහැමිව භෝග සම්පත් උපයා ගැනීමෙන් ලබන සතුටයි.

**(3)** තමා සතු සම්පත් නිසි පරිදි පරිභෝග කිරීමෙන් ලබන සතුටයි.

**(4)** නිවැරදි දිවිපෙවතක් ගත කිරීමෙන් ලබන සතුටයි.

**(5)** කාටවත් ණය නැතැයි යනුවෙන් ලබන සතුටයි. (....)

**11.** ප්‍රථම ධර්ම සංගයනාව සඳහා විශේෂිත වූ ආකාරය හේතුවක් ලෙස සැලකෙන්නේ ආනන්ද තෙරුන්ට එල්ල වූ චෝදනා නිරාකරණය කිරීමයි.

**(1)** බුදුරදුන්ගේ වැසි සළුව පයින් පාගාගෙන මැසීම

**(2)** බුදුරදුන් කල්පයක් වැඩ සිටින ලෙසට ආරාධනා නොකිරීම

**(3)** බුදුරදුන්ගේ ශ්‍රී දේහය පළමුව භික්ෂුනීන්ට නොවෙන්වීම

**(4)** භික්ෂුනී සමාජය පිහිටුවීමට මුල් වීම

**(5)** කුඩා අනු කුඩා ශික්ෂා පද මොනවාදැයි නොසෙවීම (....)

**12.** ථේරවාදී මූලාශ්‍රවලට අනුව වජ්ජිපුත්තක භික්ෂූන් විසින් අකැප කරුණු දහයක් කැප යයි සම්මත කොට ගෙන විනය විරෝධී ව ක්‍රියා කිරීම නිසා දෙවෙනි ධර්මසංගායනාව පැවැත්වීමට සිදු විය. වජ්ජිපුත්තක භික්ෂූන් විසින් කැප යයි සම්මතකොටගෙන තිබූ '' කප්පති අමථිතකප්ප' යන්නෙන් අදහස් කරන ලද්දේ,

**(1)** කිරිත් නොවූ දි කිරිත් නොවූ කිරි ශාලාවේ වැළඳීම කැපයි

**(2)** අතිරික්ත භෝජනය අවේලාවේ වැළඳීම කැපයි.

**(3)** නොපැසුණු යුතු සුරා පානය කිරීම කැපය.

**(4)** අඟක ලුණු තබාගෙන අවශ්‍ය විටෙක පාවිච්චිය කැපය

**(5)** හිරු අවරට ගොස් ඇඟුලක් ගතවනතුරු ආහාර ගැනීම කැපය. (....)

**13.** ''භාරතීය බෞද්ධ ඉතිහාසයේ''' නම් ග්‍රන්ථයේදී නාලන්දාවේ ආරම්භය හා සංවර්ධනයත් පරිහානියත් සවිස්තර ලෙස ඉදිරිපත් කොට තිබේ. එම ග්‍රන්ථය ලියන ලද කතුවරයා වනුයේ

**(1)** ''ඉත්සිංග්ය '' **(2)** '' තාරනාථ '' ය

**(3)** '' හියුංසියැං'' **(4)** '' හුයිලී'' ය

**(5)** '' ලාඕටසේ'' ය (....)

**14.** කුසල් අකුසල් බැහැර කිරීමේදී කායික, වාචසික, මානසික වශයෙන් ද්වාරත්‍රයෙන් ම පුද්ගලයා විසින් කුසල අකුසල ක්‍රියා සිදු කරනු ලබන බව බෞද්ධ ඉගැන්වීමය. ඒ අනුව කුසල අකුසල ධර්ම වල එන මිත්‍යා දෘෂ්ඨියෙන් බැහැර වීම.

**(1)** කායික කුසලයකි **(2)** වාචසික කුසලයකි

**(3)** මානසික කුසලයකි

**(4)** මානසික හා කායික කුසලයකි

**(5)** කායික මෙන්ම වාචසික කුසලයකි (....)

**15.** දෙවියන් සහිත ලෝකයාට දිට්ඨධම්මික සම්පරායික යන උභයාර්ථ සිද්ධිය පිණිස අනුශාසනා කරන බැවින් දෙව් මිනිසුන්ට ශාස්තෘවරයා මෙන්ම ගුරුවරයා වන බැවින්, බුදුරජාණන් වහන්සේ,

**(1)** ''සුගත නම් වන සේක ''

**(2)** '' ලෝකවිදූ නම් වන සේක ''

**(3)** '' අනුත්තරෝ පුරිස ධම්ම සාරථී නම් වන සේක ''

**(4)** '' සත්ථා දේවමනුස්සානං වන සේක''

**(5)** '' භගවා නම් වන සේක '' (....)

**16.** බුදු රජාණන් වහන්සේ ප්‍රශ්න විසඳූ ක්‍රම 4ක් පෙළ දහමේ සඳහන් වේ. ඒ අනුව චූල්ලකම්ම විභංග සූත්‍රයට අනුව විශ්ලේෂණාත්මක පිළිතුරු දීම

**(1)** '' ඒතාංස ව්‍යාකරණීය ක්‍රමය

**(2)** විභජ්ජ ව්‍යාකරණීය

**(3)** පටිපුච්ඡා ව්‍යාකරණීය

**(4)** ඨපනීය ක්‍රමය

**(5)** ඍජු දේශනා ක්‍රමය (....)

**17.** බුදුරජාණන් වහන්සේ නිදහස් චින්තනය හා ආගමික සහනශීලීත්වය අගය කළ උතුම් ශාස්තෘවරයෙකි. ඒ අනුව එම අදහස සඳහන් නොවන සූත්‍රය වන්නේ,

**(1)** පොට්ඨපාද සූත්‍රය **(2)** මහා සකුළුදායි සූත්‍රය

**(3)** කාලාම සූත්‍රය **(4)** උපාලි සූත්‍රය

**(5)** සිගාලෝවාද සූත්‍රය (....)

**18.** '' බුදු රජාණන් වහන්සේ ලෞකික ආශා නමැති ගිහිගත් නිවස තුල දැවෙන දරුවන් බේරා ගැනීමට මාර්ග යොදන්නාවූත් , බේරා ගැනීමෙන් පසු නිර්වාණභාවය නමැති ආරක්ෂක ස්ථානයට මග පෙන්වන්නා වූත් පියකු බඳුය. '' මෙම නිර්වචනය ඉදිරිපත් කළේ,

**(1)** බර්ට්‍රන්ඩ් රසල්

**(2)** මහාචාර්ය මාක්ස් මුලර්

**(3)** මහාචාර්ය ලක්ෂ්මි හරසු

**(4)** එඩ්වින් ආර්නෝල්ඩ්

**(5)** මහාචාර්ය සෝන්ඩර්ස් (....)

**19.** ''මහා නිධාන සූත්‍රය'' ඇසීමෙන් සෝවාන් ඵලයට පත් භික්නින් වහන්සේ,

**(1)** පටාචාරා භික්ෂුනීන්ය

**(2)** ඛේමා රහත් මෙහෙනින් වහන්සේ

**(3)** මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය

**(4)** උත්පලවන්නා තෙරණිය

**(5)** ධම්මදින්නා තෙරණිය (....)